<u>කැනඩාව වෙත ගුවන් තැපැල භාර ගැනීම නැවත ආරම්භ කිරීම</u>

පසුගිය දිනවල කැනඩා තැපැල් පරිපාලනයේ පැවති වැඩ වර්ජන තත්වය හේතුවෙන් කැනඩාව වෙත ගුවන් තැපැල් භාර ගැනීම තාවකාලිකව අත්හිටුවන ලෙස එරට විසින් ජාත්‍යන්තර තැපැල් පරිපාලනයන් වෙත දන්වන ලදි. මේ වන විට එම වෘත්තිය සේවක වැඩ වර්ජනය අවසන්ව ඇති බැවින් 2024 දෙසැම්බර් 23 දින සිට ඔවුන්ගේ ජාත්‍යන්තර තැපැල් මෙහෙයුම් කටයුතු නැවතත් අරම්භ කරන බව EMIS 219/2024 චක්‍රලේඛ මගින් දන්වා ඇත.

ඒ අනුව,

1. **2024 දෙසැම්බර් 23 දින සිට කැනඩාව වෙත තැපැල් භාණ්ඩ භාර ගැනීම හා අනෙකුත් මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලෙස දන්වා සිටිමි.**
2. **එරට තැපැල් මෙහෙයුම් කටයුතු ක්‍රමානුකූලව ආරම්භ කිරීමේ දී යම් ප්‍රමාදයන් ඇති විය හැකි බව දන්වා ඇති බැවින් කැනඩාව වෙත විදේශ තැපැල් අයිතම භාර ගැනීමේ දී අපගේ පාරිභෝගිකයන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන මෙන් දන්වා සිටිමි.**

12/19

නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්)

එච්.එම්.පී. හේරත්
නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්)